TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

ගරු මහින්ද රාජපක්ෂ මහතා,
අග්‍රාමාත්‍ය
අග්‍රාමාත්‍ය කාර්යාලය,
58, සර් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

2020 මැයි 22

ගරු අගමැතිතුමනි,

**කොවිඩ් 19 වසංගතය හමුවේ ගෝලීයව පෙරමුණ ගැනීමට ශ්‍රී ලංකාවට අවස්ථාවක්.**

කොවිඩ් 19 වසංගතය මැඩලීම සඳහා ශ්‍රී ලංකාවට ලැබී ඇති මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ප්‍රදානයන් පිළිබඳව ප්‍රගාමීව තොරතුරු හෙළිදරවු කිරීම තුළින් කොවිඩ් 19 වසංගතය මැඩලීම පිළිබඳව කලාපිය හා ගෝලීය වශයෙන් පෙරමුණ ගැනීමට ලැබී ඇති මහඟු අවස්ථාව පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට මෙම ලිපිය මඟින් බලාපොරොත්තු වෙමි.

ඒ සඳහා TISL ආයතනය  පහත සඳහන් පියවරයන් අනුගමනය කිරීම සුදුසු බව නිර්දේශ කරයි.

1.ලැබී ඇති ආධාර /ප්‍රදානයන් සහ ඒවායේ වියදම් වල යාවත්කාලීන තොරතුරු අඩංගු ඔන්ලයින් (මාර්ගගත) ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

2. සියලුම රජයේ ටෙන්ඩර් දැන්වීම් සහ අනෙකුත් අදාළ ලේඛනයන්හි, තාක්ෂණික ඇගයීම් වාර්තා සහ තීරණ ආදිය ප්‍රසිද්ධ කිරීම සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියත් එහි ක්‍රියාත්මකභාවයත් පිළිබඳ තොරතුරු යාවත්කාලින කරමින් ප්‍රසිද්ධියට පත් කිරීම.

3. තොරතුරු දැනගැනීමේ පනතෙහි විධිවිධාන හා ඒ අනුව තොරතරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම විසින් ප්‍රකාශයට පත් කර ඇති රෙගුලාසිවලට අනුකූලව සියලුම රාජ්‍ය ආයතනවල වාර්තා කළමනාකරණය දැඩිව අනුගමනය කිරීමේ අවශ්‍යතාවය තහවුරු කරමින් චක්‍රලේඛයක් නිකුත් කිරීම.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය දන්නා පරිදි මේ දක්වා, ලෝක බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 128 ක්ද, යුරෝපා සංගමය යුරෝ මිලියන 22ක් ද ඇමෙරිකා එක්සත් ජනපදය ඇමෙරිකානු ඩොලර් මිලියන 6 ක් ද ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 මැඩලීමේ වැයම වෙනුවෙන් ලබා දීමට පොරොන්දු වී ඇති අතර චීන රජය ඩොලර් මිලියන 500 ක සහන ණයක් ලබා දී ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවද කොරෝනා වයිරසය සඳහා වූ සාර්ක් (SAARC) හදිසි අරමුදල සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 5ක  මුදලක් පොරොන්දු වී ඇති බවද TISL ආයතනය දැනුවත්ය. තවදුරටත්, කොවිඩ් - 19 සෞඛ්‍ය සේවා හා සමාජ ආරක්ෂණ අරමුදල සඳහා රුපියල් බිලියනයකට වඩා වැඩි පරිත්‍යාගයන් ලැබී ඇති බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිවේදනය කර ඇත.

පූර්ණ විනිවිදභාවයකින් යුතුව සමාජ ආරක්ෂණ අරමුදල භාවිතයට ගැනීමත් එහි විගණනය කරන ලද ගිණුම් වල තොරතුරු මහජනතාවට ලබාදීමටත්, පිළිබඳව වූ ජනාධිපතිවරයාගේ පොරොන්දුව ඉතා ඉහලින් අගය කරන අතරම, විදේශයන්ගෙන් ලැබෙන අරමුදල්/ප්‍රදානයන් භාවිතයට ගැනීමේදී විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා තොරතුරු අනාවරණය කිරීමේ ජාත්‍යන්තර යහ භාවිතයන් අනුගමනය කිරීමට මුදල් අමාත්‍යවරයා ලෙසින් ඔබගේ බලතල  ක්‍රියාවට නංවන මෙන් අපි ඔබගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නෙමු.

"කොවිඩ් - 19 සඳහා වූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති" මාලාවේ අඩංගු වන  රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ ලේඛනය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) අවධාරණය කරන්නේ, කොවිඩ් 19 මැඩලීම සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තින්හි සාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් වැදගත් වන්නේ මූල්‍ය විනිවිදභාවය තහවුරු කිරීම, මහජනතාව කෙරෙහි වගවීම සුරක්ෂිත කිරීම සහ ආයතනික නීත්‍යානුකූලභාවය පවත්වා ගැනීම බවයි.

Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Directors: Anushika Amarasinghe Shyamala Gomez Camena Guneratne Pavithra Kailasapathy

යුනෙස්කෝව (UNESCO) සහ අන්තර්ජාතික තොරතුරු කොමසාරිස්වරුන්ගේ සම්මේලනය විසින් අත්සන් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශනයෙහි, "තීරණ සහ ගනුදෙනු ලේඛනගත කිරීමේ අවශ්‍යතාවය", ක්‍රියාවට නැංවිය යුතු ප්‍රමුඛතම කාර්යයක් ලෙස දක්වා ඇත. එහි සඳහන් වන්නේ කොවිඩ් - 19 මැඩලීමට කටයුතු කිරීමේදී රජයයන් විසින් කිසිදා නොවූ විරූ ක්‍රියාමාර්ගයන්ට යොමු වන හෙයින් එම ක්‍රියාමාර්ගයන් පිළිබඳ ක්‍රමානුකූලව වාර්තා පවත්වගෙන යාම වෙන කවරදාටත් වඩා වැදගත් වන බවයි. එම ප්‍රකාශනයේ වැඩි දුරටත් සඳහන් වන අන්දමට මෙවැනි හදිසි/ආපදා අවස්ථාවන්හි දී සහ ඉන් පසුවද රජයයන් හි වගවීම පවත්වාගැනීමට නම්, එළඹෙනු ලැබූ තීරණවල පදනම, එම තීරණයන්, එම තීරණයන් ගැනීමට සම්බන්ධ වූ ජ්‍යෙෂ්ඨ තීරකයන් ආදිය තරයේ ලේඛන ගත කිරීම ඉතා අත්‍යවශ්‍ය වන බවයි.

තවද, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව ගෝලීය නිරීක්ෂණ ආයතනයක් වන 'ආර්ටිකල් 19' මඟින් පලකරනු ලැබූ නවතම සමාලෝචන ලිපිය මඟින් පිළිගෙන ඇති ආකාරයට, ලොව පුරා රජයයන්, ව්‍යාපාරයන් හා ප්‍රජාවට අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීම වෙනුවෙන් ඩොලර් බිලියන ගණනින් ප්‍රතිපාදන වෙන්කර තිබේ. ඔවුන් වැඩිදුරටත් අවධාරණය කරන්නේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සහ මෙම අසාමාන්‍ය මුදල් වියදම් කිරීම අධීක්ෂණයක් යටතට පත් කිරීම අත්‍යවශ්‍ය වන බවත් එම විනිවිදභාවය මගින් මුදල් සාධාරණව හා ඥානාන්විතව භාවිත කිරීමත්, දූෂණය අවම කිරීමත් සහතික කරනු ඇති බවයි.

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් රටේ පරිපාලනය තුළ ඇති වූ දුෂ්කරතා හා අභියෝගයන් අපි හොඳින් වටහා ගෙන ඇත්තෙමු. ආපදා තත්වයේ අවදානම අභ්‍යන්තරික වශයෙන් අවම කිරීමට ශ්‍රී ලංකා රජය දරන වෑයම අගය කරන අතරම TISL ආයතනය විශ්වාස කරන්නේ මෙවැනි අවස්ථාවල වගවීම වෙන කවරදාටත් වඩා වැදගත් වන බවයි.

රජය, මහජනතාව සමග හැකි තරම් තොරතුරු හුවමාරු කර ගැනීමෙන් එක් එක් පුරවැසියාට දැනුවත් වූ තීරණ වලට එළැඹීමේ හැකියාව ලැබෙන අතර එය රජය ගනු ලබන උත්සාහයන් පිළිබඳව මහජන විශ්වාසය ගොඩ නැගීමට උපකාරී වනු ඇත. ඊට අමතරව බාහිරව වගවීමේ පවුරක් ලෙස මහජන පරීක්ෂාව ද අඩංගු කිරීම තුළින් දූෂණ අවදානමද අවම කර ගත හැකි වනු ඇත. අදාළ තොරතුරු ලබා ගැනීමට හැකි වීම තුළින් කාලයේ අවශ්‍යතාවය අනුව වියදම් සිදු කිරීම සාධාරණීකරණය වඩාත් සහතික කරයි.

පසුගිය මාස දෙක පුරාවට, කොවිඩ් - 19 මැඩලීම හා සම්බන්ධව අඩු අදායම් ලාභීන්ට රුපියල් 5,000 ක් ලබා දීමේ සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රතිපාදන වෙන් කිරීමේ කටයුතු වල විනිවිදභාවය හා වගවීම කෙරෙහි මහජන අවධානය යොමු වූ අතර ඒ පිළිබඳව මහජනතාව විසින් TISL ආයතනයේ ද අවධානය යොමු කරවන ලදී. කොවිඩ් - 19 මැඩලීමේ ක්‍රියාන්විතයේ සෑම අංශයකම දැඩි අවධානය යොමු විය යුත්තේ අවසාන වශයෙන් වසංගතයේ වින්දිතයා වන්නේ මහජනතාවය, යන අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමටය. එහෙයින් ආපදාවට එරෙහිව ක්‍රියාත්මක වීමේදී දූෂණය සහ දුර්වල කළමනාකරණය කෙරෙහි කිසිසේත්ම ඉඩක් නොතැබිය යුතුය.

TISL ආයතනය කාරුණිකව ඉල්ලා සිටින්නේ, රටේ මුදල් අමාත්‍යවරයා වශයෙන්, ඉහත සඳහන් කර ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඔබ විසින්ම මූලික පියවරයන් ගන්නා ලෙසයි. මෙවැනි කාල සීමාවක් තුළ දී ඉක්මන් පියවර ගැනීමෙන්, කොවිඩ් - 19 වසංගතය මැඩලීමේදී තොරතුරු හුවමාරු කිරීම හා මහජන මැදිහත්වීම පිළිබඳ ගෝලීය ව පෙරමුණ ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබෙනු ඇත. මහජන සුබසිද්ධිය උදෙසා කරනු ලබන්නා වූ මෙම වෑයමේදී අපගේ සහයෝගය ලබා දීමට අපි ඉමහත් කැමැත්තෙන් පසු වෙමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

..............................................

අසෝක ඔබේසේකර
විධායක අධ්‍යක්ෂ,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා.